www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සදාම් හුසේන් උසාවියේ: ඇමරිකා එක්සත් ජනපදයෙහි නිෂ්පාදිත රඟ දැක්වූ නඩු විභාගයක්

**Saddam Hussein in court: a show trial made in the USA**

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2004 ජූලි 5**

පසු ගිය බ්‍රහස්පතින්දා සදාම් හුසේන් කෙටි වේලාවකට උසාවියට ඉදිරිපත් කිරීම දේශපාලනිකව රඟ දැක්වෙන නඩු විභාගයක සියලු ආටෝපවලින් යුක්ත විය. යුද්ධයකට මැදි වී සිටින ඉරාකයේ එක්සත් ජනපද ආක්‍රමනික තන්ත්‍රයටත් රට තුල ම බුෂ්ගේ දේශපාලන ඉරනමටත් මුක්කු ගසා ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, එක්සත් ජනපද පරිපාලනය සිය දේශීය සහචරයන්ගේ සහයෝගය ඇතිව එය වේදිකාගත කලේ ය.

ඉරාක වැසියන් තමන් ම උදෙසා යුක්තිය ඉටු කිරීමක් මෙම සිද්ධියෙන් නියෝජනය වේ ය යන මවා පෑම පවත්වා ගෙන යාමට සහාය දෙමින්, එක්සත් ජනපද සහ ජාත්‍යන්තර මාධ්‍ය, සාමාන්‍යයෙන් ඔවුන් ක්‍රියා කරන ආකාරයෙන්, තමන්ට පැවරුනු ක්‍රියා කලාපය ඉටු කලේ ය. හුසේන්ගේ අපරාධවලට එක්සත් ජනපදය හා සෙසු මහ බලවතුන් දුන් සහයෝගය සම්බන්ධයෙන් ඔවුහු මුලුමනින් ම මුනිවත රැක්කාහ.

ඉරාක ජනතාවට එරෙහිව සිදු කල භයංකර අපරාධ සම්බන්ධයෙන් නිසැකව ම වරදකරුවකු වන කෲර, මෘග ආඥාදායකයකු වූ හුසේන්ට *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කිසිදු සහයෝගයක් නො දෙයි. එහෙත් මෙම වියපත් බලවත්‍ා විනිශ්චය මන්ඩලයේ හෝ ඉරාකය තුල එක්සත් ජනපද වාඩි ලෑමේ හෝ යුක්ති යුක්ත භාවය පිලිගැනීම මුරන්ඩු ලෙස ප්‍රතික්ෂේප කරමින් සිය චෝදකයන්ට වඩා වැඩි ගරුත්වයක් හා අවංක භාවයක් සහිතව හැසුරුනු බව අපේ අවධානයට ලක් විය යුතු ය. "ඔබ දන්නවා, මේ සියල්ල බුෂ් නමැති අපරාධකරුවා තම (මැතිවරන) ව්‍යාපාරයට සහාය ලබා ගනු පිනිස රඟ දක්වන නාටකයක් බව" යැයි ඔහු අවඥාවෙන් යුතුව විනිශ්චයකරුවන්ට කියා සිටියේ ය.

මිනිත්තු 30ක් වූ නඩු විභාගයේ සෑම අංගයක් ම, ආරම්භයේ සිට අවසානය දක්වා ම, "ඇමරිකා එක්සත් ජනපදයෙහි නිෂ්පාදිත ය" යන මුද්‍රාව මුලුමනින් ම දරා සිටියේ ය. බැග්ඩෑඩ් නුවරබඳ එක්සත් ජනපද මිලිටරි කඳවුරක සැකසූ තාවකාලික අධිකරන ශාලාවක හුසේන් පෙනී සිටි අතර ඇමරිකානු හෙලිකොප්ටර අඛන්ඩව ඒ වටා කරකැවෙන හඬ පසුබිමින් ඇසුනි. ඔහුත් ඔහුගේ තන්ත්‍රයේ සෙසු ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් 11 දෙනෙකුත් නො දන්නා ස්ථානවල සිට කඳවුර වෙත ගෙන එන ආවෝ එක්සත් ජනපද සොල්දාදුවෝ ය, පසුව හුදු ප්‍රදර්ශනය උදෙසා ඉරාක පොලීසිය ඔවුන් අධිකරන ශාලාව වෙත කැඳවා ගෙන ආවේ ය.

ඔවුන් උසාවියට ඉදිරිපත් කිරීමේ ක්ෂනික අරමුන වූයේ රැඳවියන් දැන් සිටින්නේ ඉරාක අත් අඩංගුවේ ය යන ප්‍රබන්ධය ස්ථාපනය කිරීම ය. ජූනි 28 දා පරමාධිපත්‍යය ආකාරගතව භාර දීමට පෙරාතු සති ගනනාව තිස්සේ බුෂ් පරිපාලනය අවධාරනය කොට තිබුනේ හුසේන් දිගට ම සිටිනු ඇත්තේ නව අන්තර් වාර ඉරාක ආන්ඩුවේ නො ව තම අත් අඩංගුවේ බව යි. එහෙත් වාඩි ලෑම කියූ පරිදි අවසන් වෙතොත් යුද සිරකරුවකු ලෙස හුසේන් දිගට ම රඳවා ගැනීම සඳහා කිසිදු නෛතික පදනමක් නොමැති විය. එබැවින් හුසේන් ඉරාක අධිකරනයක් වෙත නාමිකව "භාර දෙන ලදි," ඒ, දවස අවසානයේ ඇමරිකානු මිලිටරි සිර කඳවුරක් වෙත ඔහු යලි රැගෙන එන තෙක් පමනි.

නිර්නාමික ඉරාක විනිශ්චයකරුවකු නඩු විභාගය නාමිකව මෙහෙයවූ නමුදු එක්සත් ජනපද නිලධාරීහු පැහැදිලිව ම එහි පාලනය දරා සිටියහ. එහි පැවතියේ කුඩා හා ප්‍රවේශමෙන් තෝරා ගැනුනු සභාවකි. ඇමරිකානු මිලිටරි නිල ඇඳුමින් සැරසී සිටියවුන් දක්නට නො ලැබුනත් *නිව් යෝක් ටයිම්ස්* පත්‍රය පැහැදිලි කල පරිදි: "... නව ඉරාක ආන්ඩුවේ නිලධාරීහු ඇමරිකානු වාර්තාකරුවන් තිදෙනකු හා ඇමරිකානු නිලධාරීන් තිදෙනකු සමග එකට වාඩි වී සිටියහ. එම ඇමරිකානු නිලධාරීන් තිදෙනා නම් ඉරාක විනිසුරුට උපදෙස් දෙන නීතිඥයන් දෙදෙනකු සහ ප්‍රකාශකයකු ලෙස ක්‍රියා කරන එක්සත් ජනපද නාවික අද්මිරාල්වරයෙකි. ඔහු පැමින සිටියේ ලා දුඹුරු පැහැ චිනෝස් කලිසමකින් හා කහ පැහැති අත් කොට ක්‍රීඩා කමීසයකින් සැරසී ගෙන ය."

මාධ්‍ය ආවරනය දරුනු ලෙස සීමා විය. කිසිදු ඉරාක වාර්තාකරුවකුට අධිකරන ශාලාවට ඇතුලු වීමට අවසර නො වී ය. මාධ්‍යවලට නිකුත් කල ආරම්භක වීඩියෝ පටය ශබ්දයෙන් තොර විය. කෘතහස්ත මැද පෙරදිග වාර්තාකරු රොබර්ට් ෆිස්ක් දි *ඉන්ඩිපෙන්ඩන්ට්* පත්‍රයට පැහැදිලි කල පරිදි, හඬ පටය නිකුත් කෙරුනේ පසුව ය, එක්සත් ජනපද නිලධාරීන් කන්ඩායමක් ඒවා වාරනයට ලක් කිරීමෙන් අනතුරුව ය. නඩු විභාගය

අවස්ථාවේ එහි සිටි ඇමරිකානු රූපවාහිනී කන්ඩායමක සාමාජිකයෙක් පසුව ෆිස්ක්ට මෙසේ පැවසී ය: "රංගනය මෙහෙයවූවෝ ඔවුහු ය. මෙම නඩු විභාගයෙන් ලෝකයාට දැකිය හැක්කේ මොනවා ද දැකිය නො හැක්කේ මොනවා ද යන වග තීන්දු කලෝ ඇමරිකානුවෝ ය -- එහෙත් එය ඉරාක නඩු විභාගයක් ලෙස සාමාන්‍යයෙන් සැලකුනි. අධිකරන ශාලාව තුල බ්‍රිතාන්‍ය නිලධාරියකු සිටි අතර ඔහුගේ රූව පෙන්වීමට අපි අවසර නො ලදිමු. එහි සිටි අනෙක් අය නම් උසාවියේ 'සිවිල් වැසියන්' ලෙස පෙනී සිටීමට හැකි වන පරිදි සාමාන්‍ය ඇඳුමින් සැරසීමට අන ලැබ තිබූ එක්සත් ජනපද හමුදා භටයන් ය."

වංචාව තව දුරටත් එලිදරව් වූයේ හුසේන් වෙනුවෙන් විත්තියේ නීතිඥයෙක් නො සිටියේ ය යන කරුන මගිනි. නෛතික ආරක්ෂාව වෙනුවෙන් ඔහුට වියදම් දැරිය හැකි දැයි සභාපති විනිසුරුවරයා හුසේන්ගෙන් උද්ධච්ච ලෙස විමසූ නමුත්, හුසේන්ගේ බිරිඳ සහ දූවරුන් විසින් සංවිධානය කෙරුනු නීතිඥ කන්ඩායමකට, සිය සේවා දායකයා වෙත හෝ පැමිනිලි පාර්ශ්වය නඩුව වෙනුවෙන් ගොනු කරන ලියවිලිවලට හෝ ප්‍රවිෂ්ට වීමට ඉඩ ලැබී නැත. එක්සත් ජනපදය පත් කල ඉරාක නායකයන් තමන්ට මරන තර්ජන එල්ල කර ඇතැයි චෝදනා කල මෙම නීතිඥයන්, ඉරාකයට සුරක්ෂිතව පැමිනීමට තමන්ට ඇති අවසරයත් ඉරාකය තුල තමන්ගේ ආරක්ෂාවත් සහතික කර දෙන ලෙස ඉල්ලමින් ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය, එක්සත් ජනපදය, ප්‍රන්සය, බ්‍රිතාන්‍යය හා බෙල්ජියම වෙත ආයාචන ඉදිරිපත් කොට ඇත. තමන්ට හුසේන් වෙත ප්‍රවිෂ්ට වීමට අවසර දීම ඇමරිකානු අධිකාරීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමට එරෙහිව මේ නීතිඥ කන්ඩායම එක්සත් ජනපදයෙහි නඩුවක් ගොනු කොට තිබේ.

හුසේන්ගේ නීතිඥ කන්ඩායමට නායකත්වය දෙන ජෝර්දාන නීතිඥ මොහොමඩ් රෂ්ඩාන් පසු ගිය සතියේ නඩු විභාගය හෙලා දැක්කේ ය: "නඩු විභාගයේ විහිලුව මගින් පෙනී යන්නේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැති බව ය. නීතිඥයකු නැතිව ඔවුහු ඔහුගෙන් කිසිදු ප්‍රශ්නයක් නො විමසිය යුතුව තිබුනහ.... අපි පැහැදිලි නෛතික උල්ලංඝනයන්ට මුහුන දී සිටිමු. මෙය සාධාරන නඩු විභාගයක් වනු ඇතැයි කරන ප්‍රකාශවලට කිසිදු පදනමක් නැත.... සාධාරන නඩු විභාගයක් ජෝර්ජ් බුෂ්ට එරෙහි අධිචෝදනාවක් වනු ඇති බැවින්, ඔවුහු සත්‍යය එලිදරව් වීම ගැන බියෙන් පසු වෙති. තමන් ඉරාකයට ඇතුලු වීම නීත්‍යනුකූල ද නැද්ද යන වග ඔහු මුලින් ම ඔප්පු කල යුතු ය."

## නීති විරෝධී උසාවියක්

කල් තියා සංවිධානය කොට රඟ දැක්වූ හුසේන්ගේ නඩු විභාගය "ඉරාක විශේෂ අධිකරනයේ" ප්‍රෝඩාකාරී ස්වභාවය තව දුරටත් අවධාරනය කරයි. පසු ගිය වසරේ එය පිහිටුවන ලද්දේ එක්සත් ජනපද සන්ධානයේ තාවකාලික අධිකාරිය (සීපීඒ) සහ එහි රූකඩයක් වන ඉරාක පාලක මන්ඩලය (අයිආර්සී) විසිනි. හිටපු සර්බියානු ජනාධිපති ස්ලොබොඩාන් මිලොසෙවික්ට එරෙහි චෝදනා විභාග කරන පැරනි යුගෝස්ලාවියාව සඳහා වූ ජාත්‍යන්තර අපරාධ අධිකරනය ආකාරයේ එක්සත් ජාතීන්ගේ අනුමැතිය ඇති අධිකරනයක් පිහිටුවීමට එම මන්ඩල දෙක ම දෘඪතරව විරුද්ධ විය.

මොන යම් මට්ටමක හෝ පිටස්තර සුපරීක්ෂාවක් හා පාලනයක් සම්බන්ධයෙන් බියට පත්ව සිටින බුෂ් පරිපාලනය ස්වාධීනත්වයේ දෘශ්‍යමානයක් වත් නැති අධිකරනයක් පිහිටුවා තිබේ. එහි බරපැන මුලුමනින් ම දරන්නේ වොෂිංටනය යි, ක්‍රියාකාරිත්වයේ සෑම අංශයක් ම සම්බන්ධයෙන් එයට "උපදෙස්" දෙන්නේ, අඩු ගනනේ එක්සත් ජනපද නිලධාරීන් 50 දෙනෙකුගෙන් සමන්විත කන්ඩායමකි. එක්සත් ජනපදයේ මද්‍යසාර, දුම්කොල සහ ගිනි අවි පිලිබඳ කාර්යාංශය හා එක්ව පරීක්ෂන කටයුතු මෙහෙයවන්නේ එෆ්බීඅයි ආයතනය යි. එක්සත් ජනපදයේ අධිකරන දෙපාර්තමේන්තුවේ අභිචෝදකයෝ චෝදනා සැකසීමේ කටයුත්තට සහභාගි වෙති.

පසු ගිය දෙසැම්බරයේ දී අයිආර්සීය වෙත දීර්ඝ සිහිකැඳවුමක් යැවූ එක්සත් ජනපදයේ මානව අයිතීන් පිලිබඳ සුපරීක්ෂා ආයතනය (එච්ආර්ඩබ්ලිව්) ඉරාක විශේෂ අධිකරනයේ නීතියුක්ත භාවය ප්‍රවේශමෙන් ප්‍රශ්නයට ලක් කරමින් එය ජාත්‍යන්තර නීතිය සමග ගැලපෙන මට්ටමට ගෙන එනු පිනිස එහි ව්‍යවස්ථාවට සංශෝධන ගනනාවක් යෝජනා කලේ ය. අයිආර්සීය හෝ එක්සත් ජනපද ආක්‍රමනික අධිකාරීන් හෝ කිසිවෙකුත් මෙම ලිපිය ගැන මොන ම අවධානයක් වත් යොමු කොට නැත. එච්ආර්ඩබ්ලිව් ආයතනය ජනවාරි මාසයේ දී සිය විරෝධතාවන් සම්පින්ඩනය කරමින්, "විශේෂ අධිකරනය පිහිටුවිය හැකි නෛතික පදනම වන ජාත්‍යන්තර මානුෂික නීතිය තුල මොන යම් හෝ පදනමක් ප්‍රකාශයට පත් කිරීමට" එක්සත් ජනපදය "අපොහොසත් වී ඇතැයි" නිගමනය කල අතර, "පුලුල් අදහස් විමසීමකට හෝ පොදු අදහස් දැක්වීමකට මොන යම් හෝ ඉඩ ප්‍රස්ථාවක් නැති අතිශයින් ම රහසිගත" කටයුත්තක් ලෙස එම අධිකරනයේ කෙටුම්පත් විවේචනයට ලක් කලේ ය.

එච්ආර්ඩබ්ලිව් පෙන්වා දුන් පරිදි, මූලික නෛතික ක්‍රියා පටිපාටිය උල්ලංඝනය කෙරී ඇති අවස්ථාවන් අතර, විශේෂ අධිකරනයේ විනිසුරන් හා අභිචෝදකයන් ස්වාධීන, අපක්ෂපාතී හා අවශ්‍ය නෛතික අත්දැකීම්වලින් යුක්ත පුද්ගලයන් බව සහතික කිරීමට අපොහොසත් වීම ද විය. මෙම නිර්නායකයන් බැරෑරුම්ව යොදා ගත හොත් අධිකරනයේ අධ්‍යක්ෂවරයා වන එක්සත් ජනපදයේ පුහුනුව ලද නීතිඥ සලෙම් චලාබි නිතැතින් ම කපා හැරෙනු ඇත. ඔහු වනාහි මෑතක් වන තුරු ම ඉරාක අගමැති තනතුර සඳහා පෙන්ටගනයේ ප්‍රියතම අපේක්ෂකයකුව සිටි,

මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් නීතියෙන් වරදකරුවකු කෙරී ඇති, දිගු කාලීන එක්සත් ජනපද රැකඩයක් වන අහමඩ් චලාබිගේ ඥාති පුත්‍රයා ය.

සිය බාප්පා මෙන් සලෙම් චලාබි ද 1990 ගනන් මුල සීඅයිඒ සංවිධානය විසින් පිහිටුවන ලදුව දශකයකට වඩා දිගු කලක් තිස්සේ වොෂිංටනය විසින් ඍජුව ම මූල්‍ය ආධාර දී පෝෂනය කෙරුනු ඉරාක ජාතික කොංග්‍රසයේ සාමාජිකයෙකි. සලෙම් එක්සත් ජනපද ආක්‍රමනයේ උද්යෝගී ආධාරකරුවකු වූ අතර ඉරාකයේ එක්සත් ජනපද වාඩිලෑම හා බැඳුනු පුද්ගලික මූල්‍ය අවශ්‍යතාවන් ඔහුට පවතී. පසු ගිය වසරේ දී ඉරාක ජාත්‍යන්තර නීති කන්ඩායම (අයිඅයිඑල්ජී) පිහිටුවීම මගින් සලෙම් සිය සබඳතා හරහා මුදල් ඉපයීමට පටන් ගති. එහි වෙබ් අඩවිය සිය මෙහෙවර විස්තර කොට තිබුනේ ඉරාකයට "පුද්ගලික අංශයේ ආයෝජන ගෙන ඒමෙහි ලා මූලිකත්වය" ගැනීම ලෙස ය. "ලෝකයේ විශාලතම සංගත හා ආයතන" තම සේවා දායකයන් අතරට වැටෙන බවට ද එය පුරසාරම් දෙඩී ය.

විශේෂ අධිකරනයට පත් වූ විනිසුරුවරුන්ගේ හෝ අභිචෝදකයන්ගේ නම් "ආරක්ෂක" හේතු මත නිල වසයෙන් ප්‍රසිද්ධ කොට නො තිබුනි. එනයින් ඔවුන්ගේ පසුබිම සම්බන්ධයෙන් මොන යම් හෝ සොයා බැලීමක් කිරීම වලකා තිබුනි. කෙසේ වෙතත් හුසේන්ට චෝදනා ඉදිරිපත් කිරීම මෙහෙයවූ අනන්‍යතාව සඟවන ලද විනිසුරු වනාහි, බාත් තන්ත්‍රය යටතේ විනිසුරුවරයකු ලෙස වසර 10ක් තිස්සේ සේවය කල 33 හැවිරිදි රයිඩ් ජුහි ය යි හඳුනා ගැනීමට මාධ්‍යවේදී රොබර්ට් ෆිස්ක් සමත් විය. ඔහු අප්‍රේල් මාසයේ දී එක්සත් ජනපද වාඩිලෑම වෙනුවෙන් වෙනත් දේශපාලන සේවයක් ඉටු කලේ ය. එනම් විරුද්ධ පාක්ෂික ශියාවාදී පූජක මුක්ටාඩා අල් සද්ර්ට එරෙහිව මනුෂ්‍ය ඝාතන සම්බන්ධ අභිචෝදනා ඉදිරිපත් කිරීම ය. මෙය වනාහි, එක්සත් ජනපද මිලිටරියට අල් සද්ර්ගේ මිලීෂියාවට එරෙහිව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය කඩතුරාව සැපයූ තීන්දුවකි.

චූදිතයන්ගේ මූලික නෛතික අයිතීන් ප්‍රමානවත් අයුරින් සහතික කිරීමට විශේෂ අධිකරනයේ ව්‍යවස්ථාව අසමත් වීම පිලිබඳව ද එච්ආර්ඩබ්ලිව් ආයතනයේ සිහිකැඳවුම සිය අවධානය යොමු කරයි. සිවිල් හා දේශපාලන අයිතීන් පිලිබඳ ජාත්‍යන්තර ප්‍රතිඥාවට පටහැනි ලෙස, සැලකිය යුතු සැකයකින් තොරව වරද ඔප්පු කල යුතු ය යන්න සහතික කිරීමට ද එම ව්‍යවස්ථාව අසමත් විය. විශේෂ අධිකරනයේ ක්‍රියා පටිපාටිය බොහෝ සෙයින් පාදක වනු ඇත්තේ, බාත් පක්ෂය බලය අල්ලා ගෙන සිය ආඥාදායක පාලනය බලාත්කාරයෙන් තහවුරු කර ගැනීමෙන් පසුව 1960 ගනන් අග දී හා 1970 ගනන් මුල දී පිහිටුවූ අපරාධ නීති සංග්‍රහය මත ය. ප්‍රශ්න කරන විට හා පරීක්ෂනය තුල දී නිශ්ශබ්දව සිටීමට, නීතිඥයකුගේ සේවය ලබා ගැනීමට හෝ චෝදනාවල ස්වභාවය පිලිබඳව දැන ගැනීමට විත්තිකරුවාට පවත්නා අයිතිය විශේෂ අධිකරනයේ ව්‍යවස්ථාවෙන් සහතික නො වේ. හිතුවක්කාර රඳවා ගැනීම්වලට හෝ ශාරීරික හා මානසික වධබන්ධනවලට හෝ බලාත්කාරයෙන් ලබා ගත් පාපොච්චාරන උසාවියේ දී යොදා ගැනීමට එරෙහිව කිසිදු ආරක්ෂාවක් එමගින් නො ලැබේ.

අබු ග්‍රයිබ් සිර කඳවුරේ එක්සත් ජනපද ප්‍රශ්න කරන්නන් හා ආරක්ෂකයන් සැලසුම්සහගතව සිදු කල වධබන්ධන හා අපචාරයන් එලිදරව් වී ඇති තතු යටතේ, හුසේන් හා සෙසු "ඉහල වටිනාකමකින් යුත් රැඳවියන්" විවිධ ආකාරයේ බලාත්කාරකම්වලට දැනට මත් යටත් කෙරී ඇතැයි යන්න විශ්වාස කිරීමට ඇති තරම් හේතු පවතී. අඩු ම ලංසුවෙන් ගත හොත් ඔවුහු මාස ගනනාවක් තිස්සේ හුදෙකලාව රඳවනු ලැබ සිටිති. මෙය මත් එක් ආකාරයක මානසික බලාත්කාරකමක් වන අතර එනයින් ගත් කල එය ජිනීවා සම්මුතිය යටතේ තහනම් වූ විධික්‍රමයකි.

## වොෂිංටනයේ නොසන්සුන්කම

හුසේන්ගේ නඩු විභාගය, එහි සංවිධායකයන්ට ම එරෙහිව ආපසු කැරකී යාමේ හැකියාව සම්බන්ධයෙන් නිශ්චිත යටින් දිවෙන නොසන්සුන්තාවක් පවතින බව පසු ගිය සතියේ එක්සත් ජනපදයේ පල වූ මාධ්‍ය වාර්තා ප්‍රවාහයක් මගින් පැහැදිලි විය. හුසේන් උසාවියේ පෙනී සිටි කෙටි කාලය ඇතුලත ඔහු තම "ඉරියව්වලින් පැවසූ දෙය" සවිස්තර විච්ඡේදනයකට භාජන කිරීම ද "ඉරාක වීදිය" සිද්ධිය කෙසේ පිලිගනී ද යන්න පිලිබඳ උත්සුකතා ප්‍රකාශ වීම ද තුල මෙය දැක ගත හැකි විය. හිටපු සර්බියානු ජනාධිපති මිලොසෙවික් සිය නඩු විභාගයේ දී කර ඇති අයුරින් හුසේන් ද තම නඩු විභාගය සිය චෝදකයන්ට ම එරෙහිව හරවා ගැනීමේ හැකියාව පිලිබඳවත් එහි දේශපාලන ඇඟවුම් පිලිබඳවත් පල වූ මාධ්‍ය අටුවා තුල ද එය ප්‍රකාශයට පත් විය.

ආරම්භක මත විමසුම් හා සම්මුඛ සාකච්ඡා යම් මග පෙන්වීමක් ලෙස සැලකුව හොත් නඩු විභාගය වොෂිංටනය බලාපොරොත්තුව සිටි ආකාරයේ තුරුම්පුවක් නම් නො වනු ඇත. හුසේන් උසාවියේ පෙනී සිටීමෙන් පසුව බැග්ඩෑඩ් ගුවන් විදුලි මධ්‍යස්ථානයක් පසු ගිය සතියේ සිදු කල නොනිල මත විමසුමකට අනුව, ප්‍රතිචාර දැක්වූ අයගෙන් සියයට 45ක් හුසේන්ගේ මරනය පැතර් අතර විශ්මය ජනක ලෙස සියයට 41ක් ඔහු නිදහස් කල යුතු යි කීහ. එක්සත් ජනපද ආක්‍රමනික අධිකාරීන් සමග සමීපව වැඩ කරන පර්යේෂන හා මූලෝපායික අධ්‍යයන පිලිබඳ ඉරාක මධ්‍යස්ථානය මෑත දී සිදු කල වඩා ක්‍රමානුකූල මත විමසුමක් වාර්තා කලේ හුසේන් ක්ෂමාව ලැබීමට සුදුසු යැයි ඉරාක වැසියන්ගෙන් සියයට 20ක් සිතන බව යි.

දශක දෙකකට වැඩි කලක් තිස්සේ අතිශය කෲර ආකාරයෙන් ඉරාකය පාලනය කල හුසේන්ට යම් ආකාරයක සහයෝගයක් පැවතිය යුතු ය යන්න බුෂ්

ආන්ඩුවට එරෙහි අධිචෝදනාවකි. හිටපු ඉරාක ජනාධිපතිවරයා යම් අනුකම්පාවක් දිනා ගැනීමට සමත්ව ඇත්තේ එක්සත් ජනපදය නීති විරෝධී ලෙස ඉරාකය ආක්‍රමනය කිරීම හා වාඩිලෑම කෙරෙහි සාමාන්‍ය ඉරාක වැසියන් දක්වන පුලුල්ව පැතුරුනු වෛරය නිසා ම පමනි. බොහෝ දෙනකුට දිගට ම හැඟෙන්නේ මෙම කෲර පාලකයා කුමන ආකාරයකින් හෝ මරනයට පත් කල යුතු යි කියා ය. කෙසේ වෙතත් අනෙක් අය එක්සත් ජනපදය විසින් සිය රට මත පනවන ලද තවත් නින්දිත ආඥාවක් ලෙස නඩු විභාගය සලකන අතර ඔහුගේ දිගු කාලීන මර්දනකාරී කෲර වාර්තාව නො තකා හුසේන් පිලිබඳව රහසිගත ගෞරවයක් ප්‍රකාශයට පත් කරති.

බැග්ඩෑඩ් ආපන ශාලාවක දී *සැන් ෆ්‍රැන්සිස්කෝ ක්‍රෝනිකල්* සඟරාව වෙනුවෙන් සම්මුඛ සාකච්ඡාවකට ලක් වූ අබු අල්ලා මෙසේ ප්‍රකාශ කලේ ය: “ඔහු විනිසුරුවන් සමග තර්ක කරන ආකාරය ඔබ දැක්කා. ඇත්තට ම, ඔහු බලයේ සිටින විට මම ඔහුට කැමති වූයේ නැහැ -- වතාවක් ඔහු මගේ සහෝදරයාගේ ඉඩම අත්පත් කර ගෙන එයා හය මාසෙකට සිරගෙට යැව්වා. ඒත් ඔබ මතක තබා ගත යුතු යි, ඔහු තව මත් අපේ නායකයා බව, ඉරාක වැසියෙක් බව. තමන් බියගුල්ලකු නො වන බව ඔහු පෙන්වා තිබෙනවා. ඒක හොඳයි.” තවත් බොහෝ ඉරාක වැසියන් එක්සත් ජනපද ආක්‍රමනය විසින් නිර්මානය කරන ලද සමාජ ව්‍යසනය හමුවේ තම දෛනික පැවැත්ම රැක ගැනීමෙහි ලා මුලුමනින් ම නිමග්න වී සිටින තතු තුල හුසේන්ගේ නඩු විභාගය හෝ ඔහුගේ ඉරනම සම්බන්ධයෙන් උනන්දු වීමට ඔවුන්ට වේලාවක් නැත.

අරාබි නායකයන් කැපී පෙනෙන බියගුලු නිශ්ශබ්දතාවක් පවත්වා ගෙන යන නමුදු මැද පෙරදිග පුරා පුවත්පත් කතුවැකි පුලුල් මහජන වෛරය පිලිබිඹු කරමින් නඩු විභාගය සම්බන්ධයෙන් විවේචනශීලී ආකල්පයක් ගෙන තිබේ. නිදසුනක් ලෙස, *ජෝර්දාන් ටයිම්ස්* පත්‍රය අනතුරු අඟවමින් කියා සිටියේ, හුසේන් “බලයට පැමිනියේ කෙසේ ද ඔහුට බලය මත සිය ග්‍රහනය තහවුරු කර ගැනීමට උදව් කලේ කුමන රටවල් ද විශේෂයෙන් කුමන බටහිර රටවල් ද” යන වග නඩු විභාගයෙන් එලිමහනට පැමිනිය හැකි බව යි. එය තව දුරටත් ප්‍රකාශ කලේ, නඩු විභාගය “ඉරානයට හා කුවේටයට එරෙහිව යුද වැදීමටත් තමන්ගේ ම ජනතාවට එරෙහිව රසායනික අවි යොදා ගැනීමටත් අවශ්‍ය විධික්‍රම ඉරාක තන්ත්‍රයට සැපයීමෙහි ලා සමහර බටහිර රටවල් ඉටු කල ක්‍රියා කලාපය පිලිබඳව ද” වන බව යි.

හුසේන් හා බාත් පක්ෂය සමග වොෂිංටනය ගෙන ගිය දිගු කාලීන, අධම සහයෝගිතාව පිලිබඳ විස්තර නඩු විභාග ක්‍රියා දාමය තුල දී එලිමහනට පැමිනීමේ තත්වයක් එක්සත් ජනපද ආන්ඩුවට දරා ගත නොහැකි ය. සමහර වාර්තාවන්ට අනුව හුසේන් සමග සීඅයිඒ සංවිධානයට පැවති සබඳතා, 1959 දී ඉරාකයේ වාම ජාතිකවාදී නායක ජනරාල් අබ්දෙල්-කරීම් කසෙම් ඝාතනය කිරීමට හුසේන් දැරූ අසංවිධානාත්මක අසාර්ථක ප්‍රයත්නය දක්වා ම අතීතයට දිව යයි. ඉන් සිව් වසරක් ඇවෑමෙන් බාත් පක්ෂය සීඅයිඒ සංවිධානයේ ආධාරය සහිතව කුමන්ත්‍රනයක් දියත් කරමින් කසෙම් බලයෙන් පහ කලේ ය. එහි දී සීඅයිඒ සංවිධානය, අත් අඩංගුවට ගෙන මරන දන්ඩනයට ලක් කරනු පිනිස මූලික ඉරාක කොමියුනිස්ට්වාදීන්ගේ නම් හා ලිපිනයන් බාත් පක්ෂයට සැපයී ය.

හුසේන් නඩු විභාගය දේශපාලන ව්‍යසනයක් බවට පත් වීම වලකා ලනු පිනිස, බුෂ් ආන්ඩුව ඉරාක විශේෂ අධිකරනය තම දැඩි පාලනය යටතේ පවතින බවට සහතික කර ගෙන ඇත. හිටපු සර්බියානු ජනාධිපති මිලොසෙවික් හේග් නුවර නඩු විභාගයේ දී තම ආරක්ෂාව සඳහා සූදානම් වන බවත් බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් හා හිටපු එක්සත් ජනපද ජනාධිපති බිල් ක්ලින්ටන් ඇතුලු විවිධකාර අතීත හා වර්තමාන දේශපාලන නායකයන්, බෝල්කානු කලාපයේ ලේ වැකි සිද්ධීන් සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම පිලිබඳව සාක්කිකරුවන් ලෙස කැඳවීමට බලාපොරොත්තු වන බවත් වොෂිංටනය හොඳීන් දනී. ධවල මන්දිරය කොහෙත් ම කැමති නැති කාරනාවක් නම් ජෝෂ්ඨ එක්සත් ජනපද නිලධාරීන් 1980 ගනන් අග හා 1990 ගනන් මුල ඉරාකය තුල ඔවුන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් සාක්කිකරුවන් ලෙස බැග්ඩෑඩයට කැඳවීම යි.

එවැන්නක් සිදු නො වනු ඇතැයි පසු ගිය සතියේ දී ඉරාක අධිකරනයේ අධ්‍යක්ෂ සලෙම් චලාබි පැහැදිලි කලේ ය. මාස ගනනාවකට ආරම්භ නො වනු ඇති නඩු විභාගයේ නියම ක්‍රියා දාමය රූගත නො කරනු ඇතැයි ද එබැවින් “පුලුල් ප්‍රචාරයක් ලබා ගැනීමෙන්” හුසේන්ව වලකා ලනු ඇතැයි ද ඔහු මාධ්‍යවලට පැවසී ය. “පරිබාහිර” විෂයයන් (නඩු විභාගය තුලට) ගෙන ඒමෙන් විත්තිකරු වලකා ලනු පිනිස සාක්ෂ්‍ය පිලිබඳ නීති දැඩි කරනු ඇතැයි ඔහු පැහැදිලි කලේ ය. “අධිකරනය තම දේශපාලන අදහස් සඳහා වේදිකාවක් ලෙස යොදා ගැනීමට සදාම්ට අවශ්‍ය වනු ඇත. එහෙත් ඔහුට එසේ කිරීමට අපි ඉඩ නො දෙමු. ඔහුට එරෙහි ඉතා සුවිශේෂී චෝදනාවලට අපි ඔහු යොමු කරන්නෙමු” යි චලාබි පැවසී ය.

පසු ගිය බ්‍රහස්පතින්දා හුසේන්ට එරෙහිව කියවූ චෝදනා හත ප්‍රකාශයට පත් වූයේ අතිශයින් ම සාමාන්‍ය ආකාරයකිනි. එම චෝදනාවලට පහත සඳහන් දේ ඇතුලත් විය: දශක තුනක් තිස්සේ දේශපාලන විරුද්ධවාදීන් ඝාතනය කිරීම, 1974 දී ආගමික නායකයන් මරා දැමීම, 1983 දී කුර්ද් බර්සානි කන්ඩායමේ සාමාජිකයන් ඝාතනය කිරීම, 1986-88 කාල පරිච්ඡේදයේ දී කුර්ද්වරු බලාත්කාරයෙන් අවතැන් කරවීම, 1988 දී හලබ්ජාහි දී කුර්ද් වැසියන්ට විෂ වායු ප්‍රහාරයක් එල්ල කිරීම, 1990 දී කුවේටය ආක්‍රමනය කිරීම සහ කුර්ද්වරුන්ගේ හා ශියාවාදීන්ගේ 1991 නැගිටීම මර්දනය කිරීම.

මෙම එකදු සිද්ධියක් වෙනුවෙන් වත් හුසේන් තනිව ම විත්ති කූඩුවට නංවා ලිය යුතු නැත. 1980 ගනන් මුලුල්ලේ ම, රේගන් හා බුෂ් ආන්ඩු, ඉරානයට එරෙහි ලේ වැකි යුද්ධයේ දී බාත් තන්ත්‍රයට සහාය දුන් අතර එය ඉරාන සොල්දාදුවන්ට එරෙහිව රසායනික අවි යොදා ගත් විට හිතාමතා ම ඒ ගැන නො තකා සිටියහ. මෙම ආන්ඩුවල අනුමැතිය සහිතව විවිධ එක්සත් ජනපද හා යුරෝපීය සමාගම් ඉරාකයේ "මහා ජනනාශක අවි" වර්ධනය කිරීමට හා නිපදවීමට අවශ්‍ය තාක්ෂනික පහසුකම් ඉරාකයට සම්පාදනය කලේ ය.

බුෂ් ආන්ඩුව තම දේශීය ගැත්තාට එරෙහිව පියවර ගනිමින් පර්සියානු ගල්ෆ් කලාපය තුල එක්සත් ජනපදයේ මූලෝපායික පදනම් ශක්තිමත් කර ගනු පිනිස 1990 කුවේට ආක්‍රමනය කඩතුරාවක් ලෙස යොදා ගත්තේ ඉරාන-ඉරාක යුද්ධය අවසන් වීමෙන් පසුව ය. එවකට බැග්ඩෑඩයේ එක්සත් ජනපද තානාපතිනිය වූ ඒප්‍රිල් ග්ලැස්පී දකුනු ඉරාකයේ අල්-රාමල්ලා තෙල් බිම්වලින් තෙල් ඇද ගැනීම අරභයා කුවේටය සමග හුසේන්ට පැවති මතභේදයේ දී වොෂිංටනයේ සහාය ඔහුට ලැබෙතැයි විශ්වාස කිරීමට හිතාමතා ම හුසේන් දිරි ගැන්වූවා ය. 1991 දී එක්සත් ජනපදයේ නායකත්වයෙන් ඉරාකය ආක්‍රමනය කිරීමෙන් අනතුරුව ජනාධිපති බුෂ් (ජ්‍යෙෂ්ඨ) මුල දී හුසේන් තන්ත්‍රයට එරෙහිව කැරලි ගසන ලෙස කුර්ද්වරුන් හා ශියාවාදීන් දිරි ගැන්වී ය. පසුව බැග්ඩෑඩයේ මිලිටරි ඒකාධිපතියාට වඩා කුර්ද්වරුන්ගේ හා ශියාවාදීන්ගේ කැරලි මැද පෙරදිග එක්සත් ජනපද අවශ්‍යතාවන්ට තර්ජනයක් වෙතැයි යන්න පැහැදිලි වූ කල, බුෂ් හිතාමතා ම කුර්ද්වරුන් හා ශියාවාදීන් ඔවුන්ගේ ඉරනමට අත හැර දැමී ය.

හුසේන් සහ ඔහුගේ තන්ත්‍රයේ සෙසු සාමාජිකයන් ඔවුන් කල අපරාධ සම්බන්ධයෙන් නඩු විභාගයකට ලක් කල යුත්තේ ඉරාක මහජනතාව යි. එහෙත් යම් අව්‍යාජ යුක්තියක් සඳහා පවත්නා පූර්ව කොන්දේසිය නම්, ඉරාකයෙන් සියලු එක්සත් ජනපද හා විදේශ හමුදා වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් කිරීම යි. එපමනක් නො ව ඉරාකයේ වත්මන් නීති විරෝධී වාඩිලෑම සම්බන්ධයෙන් වග කිව යුතු එක්සත් ජනපද නිලධාරීන් සියල්ලන් ද එමෙන් ම හුසේන්ගේ අපරාධවලට කලින් පිටුබලය හා සහාය දුන් අය ද ඔවුන්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතිය ඉදිරියේ වග කිව යුතු ය.

© www.wsws.org